PDF Compressor Pro

# බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) සේවා ගණයේ බද්ධකරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

1. සම්බන්ධ ආයතන

| | | | |
|---|---|---|---|
| 1.1. | දෙපාර්තමේන්තුව | යොමු අංකය : 1/2/5 | දිනය 2013.04. 08 |
| 1.2. | අමාත්‍යාංශය | යොමු අංකය : කෘ/ආ/iii/106 | දිනය 2013.04.23 |
| 1.3. | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම | යොමු අංකය : DMS/D/පොදු/11/2 | දිනය:2012.12.19 |
| 1.4. | ප්‍රධාන ලේකම් (බ.ප.) නිර්දේශය | යොමු අංකය : 1/11/3/1/9/2 | දිනය 2013.07.15 |
| 1.5. | වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය : | දිනය |
| 1.6. | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය : 1/4/2/5/89 | දිනය 2013.09.12 |
| 1.7. | ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය | යොමු අංකය : | දිනය |

2. පත්කිරීම් බලධරයා :- ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, බස්නාහිර පළාත.

ක්‍රියාත්මක වන දිනය :- ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

3. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය - ප්‍රාථමික (අර්ධ ශිල්පීය)

3.2. ශ්‍රේණි - III, II, I සහ විශේෂ

3.3. පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය:-

ආයතනයන්හි කාර්යයන් ඉටුකිරීම හා පවත්වාගෙන යාමේදී අවශ්‍ය වන මූලික පහසුකම් සම්පාදනයට අදාළ වන ඉදිකිරීම්, නඩත්තු හා අලුත්වැඩියා වැනි කාර්යයන් අතුරින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) දෙවැනි හෝ තුන්වෙනි මට්ටමේ ප්‍රවීණතා / කාර්මික නිපුණතාවන් අවශ්‍යවන්නා වූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් ඒ ඒ තනතුරට අදාළව විශේෂිත කොට දක්වනු ලබන කාර්යයන් මෙම තනතුරට පැවරේ.

3.4. කාර්යයන් පැවරීම:-

ශ්‍රේණියෙන් ශ්‍රේණියට කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතරින් ඕනෑම කාර්යයක්, ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

අනුමත කරමි / නොකරමි.

දිනය 2013.5.17

එස්. අලවි මෞලානා
ආණ්ඩුකාරවර.

PDF Compressor Pro

4. තනතුරේ ස්වභාවය :- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය

5. වැටුප්

5.1. වැටුප් කේත අංකය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/ 2006 (IV) අනුව පී. එල්. 2-2006 ඒ වැටුප් ඛණ්ඩය

5.2. වැටුප් පරිමාණය -
III, II, I, විශේෂ ශ්‍රේණිය - රු.12210-10 X 130 – 10 X 145 – 10 X 160 -12 X 170 -18600

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | අදාල ආරම්භක වැටුප් පියවර | |
|---|---|---|
| III | පියවර 01 | රු. 12210 |
| II | පියවර 12 | රු. 13655 |
| I | පියවර 22 | රු. 15120 |
| විශේෂ | පියවර 32 | රු. 16730 |

6. සේවා ගණයට අයත් තනතුර/ තනතුරු

6.1. අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණි | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| බද්ධකරු | III<br>II<br>I<br>විශේෂ | 4 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු ආයතනයන්හි කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සම්පාදනය සඳහා ඒවාට අයත් පැළ තවාන් ඒකක පුළුල්ව පවත්වාගෙන යාමට අවශ්‍ය පරිදි බද්ධ ක්‍රම මගින් අවශ්‍ය ශාක ප්‍රචාරණය සිදු කිරීම හා ඊට අදාළ නඩත්තු කටයුතු |

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව: 4

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I, විශේෂ ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

7. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් : පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | |
| කුසලතා | - |



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : I/1/4/245. දිනය : 2013/09/17

PDF Compressor Pro

7.2. විවෘත බඳවා ගැනීම

7.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය: III ශ්‍රේණිය

7.2.2. සුදුසුකම් :

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබිය යුතුය. (එක්වර විෂයයන් පහ (05) ක් සමත් වී තිබීම අනිවාර්ය වේ.)

7.2.2.2. වෘත්තීය සුදුසුකම් :

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු ආයතනයක හෝ වෙනත් පිළිගත් ආයතනයක පැළ බද්ධ කිරීම මගින් ශාක ප්‍රචාරණය පිළිබඳ අවම වශයෙන් මාස 06 ක පුහුණුවක් ලබා තිබිය යුතු අතර, ඒ බව සහතිකයකින් සනාථ කළ යුතුය.

7.2.2.3. පළපුරුද්ද: අදාළ නොවේ.

7.2.2.4. කායික සුදුසුකම් -

සෑම අපේක්ෂකයෙකුම බස්නාහිර පළාත තුළ සේවය කිරීමට සහ තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

7.2.2.5. වෙනත්

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. මනා චරිතයකින් යුක්ත විය යුතුය.
III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලය තුළ බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

7.2.3. වයස

7.2.3.1. අවම සීමාව - අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2. උපරිම සීමාව - අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුක්තවූවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය: ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකිනි.

7.2.4.1. ලිඛිත විභාගය: අදාළ නොවේ.

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.2.4.1.1. පවත්වන බලධරයා

7.2.4.2. වෘත්තීය පරීක්ෂණය: අදාළ නොවේ.

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.2.4.2.1. පවත්වන බලධරයා : අදාළ නොවේ.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
දිනය 2023/09/17

PDF Compressor Pro

7.2.4.3. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු

7.2.4.3.1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : අදාළ නොවේ.

7.2.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බඳවාගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම් ලෙස දක්වා ඇති අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙ) විභාගයේදී සාමාර්ථ ලබාගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා ලබාඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02) ක උපරිමයකට යටත්ව ලකුණු ලබාදේ.<br>• සාමාන්‍ය සාමාර්ථයකට ලකුණු = 02<br>• සම්මාන සාමාර්ථයකට ලකුණු = 03<br>• අධි සම්මානයකට ලකුණු = 04<br>• විශිෂ්ඨ සම්මානයකට ලකුණු = 05 | 10 | 70% |
| ශාක ප්‍රචාරණ ක්‍රම පිළිබඳ අවබෝධය | 20 | |
| පැළ බද්ධ කිරීම පිළිබඳ සේවා අත්දැකීම | 15 | |
| පෞරුෂය | 05 | |
| මුළු ලකුණු | <u>50</u> | |

සටහන: මෙම සම්මුඛ පරීක්ෂණයේදී බඳවාගැනීමේ පරිපාටියට අනුකූලව පලකරනු ලබන නිවේදනයේ / දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේද යන්න හා තනතුරට අදාළ රාජකාරි ඉටුකිරීමට සුදුසු කායික යෝග්‍යතාවයකින් පසුවන්නේද යන්න පිළිබඳව පරීක්ෂා කර බලනු ඇත.

7.2.4.4.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා - ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, බස්නාහිර පළාත

7.2.4.5. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය -

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම පළකිරීම මගින් හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල පළකරනු ලබන දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය ..../..../245 දිනය 2013/09/17

PDF Compressor Pro

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය. : අදාළ නොවේ.

7.3.2 සුදුසුකම් : අදාළ නොවේ.

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම්

7.3.2.2 වෘත්තීය සුදුසුකම්

7.3.2.3 පළපුරුද්ද

7.3.2.4 කායික සුදුසුකම්

7.3.2.5 වෙනත්

7.3.3 වයස : අදාළ නොවේ.

7.3.3.1 අවම සීමාව

7.3.3.2 උපරිම සීමාව

7.3.4 බඳවාගැනීමේ ක්‍රමය : අදාළ නොවේ.

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.3.4.1.1 පවත්වන බලධරයා : අදාළ නොවේ.

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය. : අදාළ නොවේ.

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.3.4.2.1 පවත්වන බලධරයා : අදාළ නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : අදාළ නොවේ.

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.3.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා: අදාළ නොවේ.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: අදාළ නොවේ.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

PDF Compressor Pro

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම. : අදාළ නොවේ.

7.4.1 බඳවාගන්නා ශ්‍රේණිය. : අදාළ නොවේ.

7.4.2 සුදුසුකම් : අදාළ නොවේ.

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම්

7.4.2.2 වෘත්තීය සුදුසුකම්

7.4.2.3 පළපුරුද්ද

7.4.2.4 කායික සුදුසුකම්

7.4.2.5 වෙනත්

7.4.3 වයස : අදාළ නොවේ.

7.4.3.1 අවම සීමාව

7.4.3.2 උපරිම සීමාව

7.4.4 බඳවාගැනීමේ ක්‍රමය : අදාළ නොවේ.

7.4.4.1 ලිඛිත විභාගය

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.4.4.1.1 පවත්වන බලධරයා : අදාළ නොවේ.

7.4.4.2 වෘත්තීය පරීක්ෂණය.

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.4.4.2.1 පවත්වන බලධරයා : අදාළ නොවේ.

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු

7.4.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : අදාළ නොවේ.

7.4.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| | | |

7.4.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : අදාළ නොවේ.

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: අදාළ නොවේ.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :..1/4/4/245.. දිනය :..2013/09/17

PDF Compressor Pro

8. කාර්යක්ෂමතා කඩඉම්

8.1.

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට පත්වී වසර තුන (03) ක් ගත වීමට පෙර | වාචික පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයකි. (ඇමුණුම 01) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | වාචික පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයකි. (ඇමුණුම 02) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගත වීමට පෙර | වාචික පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයකි. (ඇමුණුම 03) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වන්නේ කොපමණ කාලයකට වරක්ද? අවශ්‍යතාවය අනුව වසරකට එක්වරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද?

1 වන කාර්යක්ෂමතා කඩඉම
2 වන කාර්යක්ෂමතා කඩඉම
3 වන කාර්යක්ෂමතා කඩඉම
} ලේකම්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය, බස්නාහිර පළාත

9 භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007, 7/2007(1) අනුව පත්වීම් දින සිට වසර පහ (05) ක් ඇතුළත අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණත්වය ලබා ගත යුතුය |
| සන්ධාන භාෂාව (අදාළ වන්නේ නම් පමණි) | අදාළ නොවේ |



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
[illegible] 11/4/45 දිනය : 2013/09/17

10. ශ්‍රේණි උසස් කිරීම.

**10.1 බද්ධකරු තනතුරේ III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම.**

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම.

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. පත්වීම ස්ථිර කර තිබීම.
ii. බද්ධකරු තනතුරේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා උපයාගත යුතු සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබීම.
iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළදී ලබාගෙන තිබීම.
vi. පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා විසින් හඳුන්වා දෙනු ලැබූ ආකෘති පත්‍රය මගින් පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, සුදුසුකම් ලබන දිනය හා වසර දහය (10) ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ. (ආකෘති පත්‍රය ඇමුණුම 06)

10.1.2 බද්ධකරු තනතුරේ III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට සුවිශේෂී කාර්ය සාධනය අනුව උසස් කිරීම.

10.1.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. පත්වීම ස්ථිර කර තිබීම.
ii. බද්ධකරු තනතුරේ III ශ්‍රේණියේ වසර හය (06) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා උපයාගත යුතු සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබීම.
iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) තුළම සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.
v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළ දී ලබාගෙන තිබීම.
vi. පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.



පළාත් ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
දිනය : 2013/09/17

PDF Compressor Pro

10.1.2.2 උසස් කිරීමේ ක්‍රමය:

ඉහත සුදුසුකම් සපුරාලන නිළධරයන් පත්කිරීම් බලධරයා හෝ ඔහු විසින් බලය පවරන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝගාත්‍මක පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ඉන් සමත්වන්නන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙතින් ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීමේ බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. අදාල සෙසු අවශ්‍යතාවන්ද සම්පූර්ණ කර ඇති නිළධරයන් පත්කිරීමේ දින සිට වසර හය (06) ක් සම්පූර්ණ වන දිනට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. (ආකෘති පත්‍රය ඇමුණුම 06)

සටහන 01

- සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස්වීම් ලබාදීමේදී පවත්වනු ලබන අභියෝගාත්‍මක පරීක්ෂණයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 60% ක් ලැබිය යුතුය. තවද, සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටිය හැක්කේ එක් වරක් පමණි. සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ විභාගය වසරකට එක් වරක් පමණක් පවත්වනු ලැබේ. (අභියෝගාත්‍මක පරීක්ෂණය විෂය නිර්දේශය ඇමුණුම 04)

- නිළධරයෙකුට පාලනය කළ නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හිදී පසුව පැවැත්වෙන අභියෝගාත්‍මක පරීක්ෂණයට එම නිළධරයාට පෙනී සිටිය හැක. එවැනි නිළධරයෙකු සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත් වූ දිනයයි.

10.2 **බද්ධකරු තනතුරේ II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම.**

10.2.1 **සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම.**

10.2.1.1. **සපුරාලිය යුතු සුදුසුකම්**

i. බද්ධකරු තනතුරේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා උපයාගත යුතු සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
ii. පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිළධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත් කිරීම් බලධරයා විසින් හඳුන්වා දෙනු ලැබූ ආකෘති පත්‍රය මඟින් පත්කිරීම් බලධරයා වෙත අදාළ නිළධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දිනය හා වසර නවය (09) ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. (ආකෘති පත්‍රය ඇමුණුම 06)



හරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : [illegible] දිනය : 2013/09/17.

PDF Compressor Pro

**10.2.2 බද්ධකරු තනතුරේ II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට සුවිශේෂී කාර්ය සාධනය අනුව උසස් කිරීම.**

10.2.2.1. සපුරාලිය යුතු සුදුසුකම්

i. බද්ධකරු තනතුරේ II ශ්‍රේණියේ වසර අට (08) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා උපයාගත යුතු සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබීම.
ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර අට (08) තුළම සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

10.2.2.2 උසස් කිරීමේ ක්‍රමය.

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් සඳහා පත්කිරීම් බලධරයා විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් 50% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා නිලධරයන් II ශ්‍රේණියට උසස් වී වසර අට (08) ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. (ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය විෂය නිර්දේශය ඇමුණුම 05)

**10.3 බද්ධකරු තනතුරේ I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.**

10.3.1 සපුරාලිය යුතු සුදුසුකම්

I. බද්ධකරු තනතුරේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා උපයාගත යුතු සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම
II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. තුන්වන කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් පත්කිරීම් බලධාරියා වෙත නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දිනය හා වසර නවය (09) ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස්කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. (ආකෘති පත්‍රය ඇමුණුම 06)



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරණ ලදී.
දිනය : 2013/09/17.

සටහන 02

- සතුටුදායක සේවා කාලය
  සතුටුදායක සේවා කාලයක් යනු රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටුකිරීම මඟින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්වීම මඟින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මඟින්ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

- සක්‍රිය සේවා කාලය
  "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

- නියමිත දිනට
  අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු දිනය "නියමිත දිනය" ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස් වීම් වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන නිලධරයන්ට බඳවාගැනීම් පරිපාටියේ සඳහන් පරිදි උසස් වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධරයන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය. (උදා :- වසර තුනකදී සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම වසර හතරකින් සමත්වුවහොත් වසර දහයකින් ලැබිය යුතු උසස්වීම ලැබෙනුයේ වසර එකොළහකිනි.)

❋ **සංලක්ෂය**

සුවිශේෂී කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වාදී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්ය සාධන ඇගයීමේ දී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කරනු ලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් සඳහා ලිඛිත අභියෝගාත්මක පරීක්ෂණය / ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

11. තනතුරු වලට පත් කිරීම - අදාළ නොවේ.

11.1 <u>සුදුසුකම්</u>

| තනතුර | සුදුසුකම් | තෝරාගනු ලබන ආකාරය |
|---|---|---|
| | | |
| | | |

(අවශ්‍ය වේ නම් ඇමුණුමක් භාවිතා කරන්න)

12. ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලටද, අනුව කටයුතු කළ යුතුය.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
2018/09/17

PDF Compressor Pro

13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත

14. මෙම බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.

සකස් කළේ: අත්සන ..................................

පරීක්ෂා කළේ:..................................
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ..................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : ආර්.පී.මහින්දපාල
තනතුර :පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බ.ප.),

ආර්.පී. මහින්දපාල
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර)
අංක 154,
මහාචාර්ය සන්දදාස කෝදාගොඩ මාවත
කොළඹ-07.

නිල මුද්‍රාව

දිනය : 2013.04.08

යොමු අංකය: ..................................

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හි බද්ධකරු තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන ..................................
නම : එස්.ටී.කොඩිකාර
ලේකම්
කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත හා පරිසර අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

නිල මුද්‍රාව

දිනය :- 2013.04. 24



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
දිනය : 2013/09/17

PDF Compressor Pro

යොමු අංකය: 1/1/3/1/9/2

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි බද්ධකරු තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන .....................................

නම : .....................................

ප්‍රධාන ලේකම් (බ.ප.)

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

නිල මුද්‍රාව

දිනය :- 2013.07.15

යොමු අංකය: 1/4/2/5/89

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි බද්ධකරු තනතුර තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

අත්සන .....................................

නම : .....................................

වී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
532/7, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ - 05.

ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)

නිල මුද්‍රාව

දිනය:- 2013. 09 .12

යොමු අංකය: 1/1/4/245

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි බද්ධකරු තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය ...2013. 09. 17...........දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇත.

සුනිල් අබේවර්ධන,
බ.ප. ආණ්ඩුකාර ලේකම්
බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
98/4, හැව්ලොක් පාර,
කොළඹ 05.

අත්සන .....................................

නම : .....................................

ආණ්ඩුකාර ලේකම්

දිනය: 2013/09/17.

නිල මුද්‍රාව



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : 1/1/4/245 දිනය : 2013/09/17

PDF Compressor Pro

ඇමුණුම 01

## පළමු කාර්යක්ෂමතා කඩඉම සඳහා වන වාචික පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය

1. **පරීක්ෂණයේ නම:** බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) සේවා ශ්‍රේණියේ බද්ධකරු තනතුරේ පළමු කාර්යක්ෂමතා කඩඉම සඳහා වන වාචික පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය

2. **පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්**

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු |
|---|---|---|
| **වාචික පරීක්ෂණය** | 60 | 50% |
| ග්‍රාහක, අනුජ තේරා ගැනීම පිළිබඳ දැනුම | | |
| විවිධ බද්ධ ක්‍රම පිළිබඳ දැනුම | | |
| ලේයර් ක්‍රම භාවිතය | | |
| **ප්‍රායෝගික පරීක්ෂණය** | 40 | 50% |
| ග්‍රාහක සහ අනුජ තෝරාගෙන පැල බද්ධ කිරීම පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණය | | |

3. **පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා:**
ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, බස්නාහිර පළාත

4. **පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග:**
අවශ්‍යතාවය අනුව වසරකට එක්වතාවක්

සකස් කළේ: අත්සන............................
(විෂයභාර නිළධාරියා)

නම: එස්. එම්. පී. මධුශානි විපුලසේන
තනතුර: කළමනාකරණ සහකාර
දිනය : 2013.04 .08

පරීක්ෂා කළේ: අත්සන............................
(විෂයභාර මාණ්ඩලික නිළධාරියා)

නම : එස්.ඒ.සඳුනි ෂර්මිලා
තනතුර : පරිපාලන නිලධාරී
දිනය : 2013.04. 08

අත්සන: ............................................
දෙපාර්තමේන්තු ප්‍රධානියා

නම : ආර්.පී.මහින්දපාල
තනතුර : පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බ.ප.)
දිනය: 2013.04 . 08

ආර්.පී. මහින්දපාල
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර)
අංක 154,
මහාචාර්ය සන්දරාස කෝදාගොඩ මාවත
කොළඹ-07.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
... 4/1/45 දිනය 2013/09/17

PDF Compressor Pro

ඇමුණුම 02

<u>**දෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා වන වාචික පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය**</u>

1. **පරීක්ෂණයේ නම:** බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) සේවා ශ්‍රේණියේ බද්ධකරු තනතුරෙහි දෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා වන වාචික පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය

2. **පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්**

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු |
|---|---|---|
| **වාචික පරීක්ෂණය** | 60 | 50% |
| බද්ධ පැල තවාන් නඩත්තුව හා පවත්වාගෙන යාම බද්ධ පැල ප්‍රවාහනය, ක්ෂේත්‍රගත කිරීම | | |
| **ප්‍රායෝගික පරීක්ෂණය** | 40 | 50% |
| බද්ධ කිරීම , බද්ධ පැල නඩත්තුව පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | | |

3. **පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා:**

   ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, බස්නාහිර පළාත

4. **පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග:**

   අවශ්‍යතාවය අනුව වසරකට එක්වතාවක්

සකස් කළේ: අත්සන..........................
(විෂයභාර නිළධාරියා)

නම: එස්. එම්. පී. මධූශානි විපුලසේන
තනතුර: කළමනාකරණ සහකාර
දිනය : 2013.04

පරීක්ෂා කළේ: අත්සන..........................
(විෂයභාර මාණ්ඩලික නිළධාරියා)

නම : එස්.ඒ.සඳුනි ෂර්මිලා
තනතුර : පරිපාලන නිලධාරී
දිනය : 2013.04. 08

අත්සන: ...............................................
දෙපාර්තමේන්තු ප්‍රධානියා

නම : ආර්.පී.මහින්දපාල
තනතුර : පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බ.ප.)
දිනය: 2013.04 .08

ආර්.පී. මහින්දපාල
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර)
අංක 154,
මහාචාර්ය සන්දාදාස ගෝදාගොඩ මාවත
කොළඹ-07.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. 2018/09/17

ඇමුණුම 03

## තෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා වන වාචික පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය

1. **පරීක්ෂණයේ නම:** බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) සේවා ගණයේ බද්ධකරු තනතුරෙහි තෙවන කාර්යක්ෂමතා කඩඉම සඳහා වන වාචික පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය.

2. **පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්**

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු |
|---|---|---|
| **වාචික පරීක්ෂණ** | 50 | 50% |
| බද්ධ පැළ තවාන්හි පළිබෝධ පාලනය<br>බද්ධ පැළ නිෂ්පාදන අවශ්‍යතා හඳුනා ගැනීම | | |
| **ප්‍රායෝගික පරීක්ෂණය** | 50 | 50% |
| බද්ධ පැළ සකස් කිරීම පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් පැවැත්වීමේ හැකියාව | | |

3. **පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා:**
ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, බස්නාහිර පළාත.

4. **පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග:**
අවශ්‍යතාවය අනුව වසරකට එක්වතාවක්

සකස් කළේ: අත්සන........................................
(විෂයභාර නිළධාරියා)

නම: එස්. එම්. පී. මධුශානි විපුලසේන
තනතුර: කළමනාකරණ සහකාර
දිනය : 2013.04.08

පරීක්ෂා කළේ: අත්සන........................................
(විෂයභාර මාණ්ඩලික නිළධාරියා)

නම : එස්.ඒ.සඳුනි ෂර්මිලා
තනතුර : පරිපාලන නිලධාරී
දිනය : 2013.04.08

අත්සන: ..................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියා

නම : ආර්.පී.මහින්දපාල
තනතුර : පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බ.ප.)
දිනය: 2013.04.08

ආර්.පී. මහින්දපාල
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බ.ප.)
අංක 154,
මහාචාර්ය [illegible] මාවත
කොළඹ-07.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
දිනය 2013/09/17

PDF Compressor Pro

ඇමුණුම 04

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) සේවා ගණයේ බද්ධකරු තනතුරෙහි III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන ලිඛිත අභියෝගතා පරීක්ෂණය**

1. **විභාගයේ නම:** බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) සේවා ගණයේ බද්ධකරු තනතුරෙහි සුවිශේෂී කාර්ය සාධනය මගින් III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන ලිඛිත අභියෝගතා පරීක්ෂණය.

2. **විභාගය පිළිබඳ විස්තර**

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය<br>ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 60% |

3. **ලිඛිත අභියෝගතා පරීක්ෂණය පවත්වනු ලබන බලධරයා:**
පත්කිරීමේ බලධරයා හෝ ඔහු විසින් බලය පවරන ආයතනයක්.

4. **පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග:**
වසරකට එක්වරක්

5. **විෂය නිර්දේශය**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය | තනතුරට අදාළව පළතුරු, එළවළු හා විසිතුරු පැළ ප්‍රචාරණ ක්‍රම පිළිබඳ මූලික දැනුම, බද්ධ ක්‍රම මගින් ශාක ප්‍රචාරණයේ වැදගත්කම, බද්ධ පැළ තවාන් නඩත්තුව, පළිබෝධ පාලනය, බද්ධ කිරීම සඳහා ශාක තෝරා ගැනීම සහ බද්ධ පැළ සාර්ථකව ක්ෂේත්‍රගත කිරීම ආශ්‍රිත දැනුම |
| ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි | ආයතන සංග්‍රහයේ VII,VIII,XII පරිච්ඡේද සහ මුදල් රෙගුලාසි සංග්‍රහයේ V, XII පරිච්ඡේදයන්ට අදාළ බහුවරණ ප්‍රශ්න. |

සකස් කළේ: අත්සන............................
(විෂයභාර නිළධාරියා)

නම: එස්. එම්. පී. මධුශානි විපුලසේන
තනතුර: කළමනාකරණ සහකාර
දිනය : 2013.04. 08

පරීක්ෂා කළේ: අත්සන............................
(විෂයභාර මාණ්ඩලික නිළධාරියා)

නම : එස්.ඒ.සඳුනි ෂර්මිලා
තනතුර : පරිපාලන නිලධාරී
දිනය : 2013.04. 08

අත්සන: ..................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියා

නම : ආර්.පී.මහින්දපාල
තනතුර : පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බ.ප.)
දිනය: 2013.04 . 08

ආර්.පී. මහින්දපාල
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර)
අංක 154,
මහාචාර්ය සන්දදාස කෝදාගොඩ මාවත
කොළඹ-07.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

PDF Compressor Pro

ඇමුණුම 05

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) සේවා ගණයේ බද්ධකරු තනතුරෙහි II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

1. **විභාගයේ නම:** බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) සේවා ගණයේ බද්ධකරු තනතුරෙහි සුවිශේෂී කාර්ය සාධනය මගින් III වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

2. **පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්**

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු | සමත්වීම සඳහා සලකා බලන අවම ලකුණු |
|---|---|---|
| බද්ධ කිරීම පිළිබඳ සෛද්ධාන්තික දැනුම මැන බැලීම. | 100 | 50% |

3. **පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා:**
ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය, බස්නාහිර පළාත.

4. **පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග:**
වසරකට එක්වරක්

සකස් කළේ: අත්සන.............................
(විෂයභාර නිළධාරියා)

නම: එස්. එම්. පී. මධුශානි විපුලසේන
තනතුර: කළමනාකරණ සහකාර
දිනය : 2013.04.08

පරීක්ෂා කළේ: අත්සන.............................
(විෂයභාර මාණ්ඩලික නිළධාරියා)

නම : එස්.ඒ.සඳුනි ෂර්මිලා
තනතුර : පරිපාලන නිලධාරී
දිනය : 2013.04.08

අත්සන: .............................
දෙපාර්තමේන්තු ප්‍රධානියා

නම : ආර්.පී.මහින්දපාල
තනතුර : පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බ.ප.)
දිනය: 2013.04.08

ආර්.පී. මහින්දපාල
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (බස්නාහිර)
අංක 154,
මහාචාර්ය සන්දාන කෝදාගොඩ මාවත
කොළඹ-07.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/1/4/24 දිනය : 2013/09/17

PDF Compressor Pro



# ශ්‍රේණි උසස්වීම් ලබාගැනීම සඳහා වූ අයදුම්පත්‍රය

1. නිලධරයා පිළිබඳ තොරතුරු
    - 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..........................................................................................
    ..........................................................................................
    - 1.2 හැඳුනුම්පත් අංකය : ..........................................................................................
    - 1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..........................................................................................
    ..........................................................................................
    - 1.4 අයත්වන සේවය හා තනතුර : ..........................................................................................
    - 1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ..........................................................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු
    - 2.1 පත්වීම් දිනය : ..........................................................................................
    - 2.2 පත්වීම ස්ථිර කළ දිනය : ..........................................................................................
    - 2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

    - 2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස් වීමට අදාළ තොරතුරු
    - 3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : 11/ 1 / විශේෂ
    - 3.2 උසස් වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය / සුවිශේෂී
        - 3.3.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත.
        - 3.3.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ..........................................................................
        - 3.3.3 අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබේද? ඔව් / නැත.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/1/4/245 දිනය : 2023/09/17

PDF Compressor Pro

3.3.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව් / නැත.

උසස්වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව් /නැත.

3.3.5 විනය දඬුවම් ලබා තිබේද? ඔව් / නැත.

3.3.6 සුවිශේෂී කාර්ය සාධනය යටතේ වූ ලිඛිත විභාගය සමත් වූ දිනය : ..........................

3.3.7 විභාගයේදී ලබා ගත් ලකුණු ප්‍රමාණය : ..................................

3.3.8 සුවිශේෂී කාර්ය සාධනය යටතේ වූ ලිඛිත විභාගයට පෙනී සිටි වාර ගණන : ......................

3.3.9 නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය සඳහා වූ අභියෝගාත්මක පරීක්ෂණය සමත්වීමට නොහැකි වුයේ නම් ඊට හේතු : ..................................

4. **අයදුම්කරුගේ ප්‍රකාශය**

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් .............................. දින සිට සාමාන්‍ය කාර්යසාධනය/ සුවිශේෂී කාර්යසාධනය යටතේ 11/ 1/ විශේෂ ශ්‍රේණියට උසස් වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ..................................

..................................................
නිලධරයාගේ අත්සන

5. **දෙපාර්තමේන්තු ප්‍රධානගේ නිර්දේශය**

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම් සඳහන් ........................................................................................................ මහතා/ මිය/ මෙනවිය ............................ සේවා ගණයේ .................. ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය/ සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියළු කරුණු සම්පූර්ණ කර ඇති බවටත්, සෑහීමකට පත් වෙමි. ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

අත්සන ..........................................

නිල මුද්‍රාව .......................................



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/4/4/245 දිනය : 2013/09/17

PDF Compressor Pro

6. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත්/ නිවැරදි නොවන බවත්, ඒ අනුව ඉහත නිර්දේශය හා එකඟ වන බවත්,/ නොවන බවත් කාරුණිකව දන්වමි.

අත්සන ............................................

නිල මුද්‍රාව ........................................

7. ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඒ අනුව ............................................................ මහතා/ මිය/මෙනවිය .............................. සේවා ගණයේ ................... ශ්‍රේණියට සාමාන්‍ය කාර්ය සාධනය/ සුවිශේෂී කාර්ය සාධනය යටතේ ..................... දින සිට උසස් කිරීම නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ............................................

නිල මුද්‍රාව ........................................



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/24/5 දිනය 2012/09/17